# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2390/18 - 2024 ජුනි මස 28 වැනි සිකුරාදා - 2024.06.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

එල්.ඩී.-බී. 9/2016(III)

**2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත**

2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත යටතේ පිහිටුවන ලද මිල නියම කිරීමේ කමිටුව, 2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත යටතේ පිහිටුවන ලද පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය සහ සියලු පරදු දරන්නන් විමසා සහ 2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ විධිවිධාන ඇතුලු වෙනත් සියලු අදාළ සාධක පිළිබඳ සැලකිල්ලට ගෙන 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 118 වන වගන්තියේ (4) වන උපවගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 142 වන වගන්තිය යටතේ සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

වෛද්‍ය **රමේෂ් පතිරණ,**
සෞඛ්‍ය අමාත්‍ය.

2024 ජුනි මස 26 දින,
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග 2024 අංක 01 දරන ඖෂධ (යම් නිශ්චිත ඖෂධයක ඖෂධ මාත්‍රා ආකාරයට සහ ප්‍රබලතාවයට අදාළව උපරිම සිල්ලර මිලක් නිශ්චය කිරීම සඳහා වූ මිල නිර්ණය කිරීමේ ක්‍රමවේදය) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. විනිවිදභාවය සහ සාධාරණත්වය සහතික කිරීමේ අරමුණින් යුතුව යම් නිශ්චිත ඖෂධයක ඖෂධ මාත්‍රා ආකාරයට සහ ප්‍රබලතාවයට අදාළව මිල නිර්ණය කිරීමේ ක්‍රමවේදයක් ස්ථාපනය කිරීම මෙම නියෝගවල අරමුණ වන්නේ ය.

3. යම් නිශ්චිත ඖෂධයක ඖෂධ මාත්‍රා ආකාරයට සහ ප්‍රබලතාවයට අදාළ වූ උපරිම සිල්ලර මිල පහත දැක්වෙන පරිදි තීරණය කරනු ලැබිය යුතු ය; එනම්-

1A - PG 6757 — 604 (2024/06)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(අ) ජාත්‍යන්තර වශයෙන් පිළිගත් තොරතුරු මූලාශ්‍ර භාවිතා කිරීම මගින් ඖෂධ සංයෝගයක විවිධ වෙළඳ නාම හෝ ඖෂධීය නාමවලට අදාළ වෙළඳපොළ කොටස් වටිනාකම හඳුනාගැනීම; සහ

(ආ) දිවයිනේ විවිධ ප්‍රදේශවල සිල්ලර ඔසුසල්වලින් සහ ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව (එස්.පී.සී) විසින් සපයනු ලබන තොරතුරුවලින් යම් නිශ්චිත ඖෂධයක මාත්‍රා ආකාරයට සහ ප්‍රබලතාවට අදාළ වන සිල්ලර මිල ගණන් තහවුරු කිරීම.

(2) සමුච්චිත ලෙස වෙළඳපොළ කොටසේ වටිනාකම සියයට අසූවක් (80%) හෝ ඊට වැඩි වූ, ඒ නිශ්චිත ඖෂධයේ ඖෂධ මාත්‍රා ආකාරයට සහ ප්‍රබලතාවට අදාළ ප්‍රාරම්භකය ඇතුළුව යම් නිශ්චිත ඖෂධයක එකී මාත්‍රා ආකාරයට සහ ප්‍රබලතාවයට අදාළ වන සියලු වෙළඳ නාම සහ ඖෂධීය නාම වර්ග සම්බන්ධයෙන් වූ සිල්ලර මිල ගණන්වල මධ්‍යස්ථ අගය ගණනය කිරීම මගින් යම් නිශ්චිත ඖෂධයක ඖෂධ මාත්‍රා ආකාරයට සහ ප්‍රබලතාවට අදාළ වූ උපරිම සිල්ලර මිල, ලබා ගත යුතු ය.

4. යම් නිශ්චිත ඖෂධයක ඖෂධ මාත්‍රා ආකාරයට සහ ප්‍රබලතාවයට අදාළවූ උපරිම සිල්ලර මිල පහත දැක්වෙන මිල නිර්ණය කිරීමේ ක්‍රමවේදයට අනුකූලව ගණනය කරනු ලැබිය යුතු ය :-

(අ) වෙළඳපොළ කොටසේ වටිනාකම සියයට අසූවක් (80%) හෝ ඊට වැඩි වූ, එකී ඖෂධයේ ප්‍රාරම්භකය ඇතුළුව යම් නිශ්චිත ඖෂධයක ඖෂධ මාත්‍රා ආකාරයකට සහ ප්‍රබලතාවයකට අදාළ සියලු වෙළඳ නාම සහ ඖෂධීය නාම වර්ග සම්බන්ධයෙන් වූ සියලු සිල්ලර මිල ගණන් ආරෝහණ අනුපිළිවෙළට සකස් කිරීමෙන්; සහ

(ආ) (අ) ඡේදයේ සඳහන් පරිදි සිල්ලර මිල ගණන් සකස් කිරීමෙන් පසුව, මධ්‍යස්ථ සිල්ලර මිල පහත දැක්වෙන පරිදි නිශ්චය කරනු ලැබිය යුතු ය :-

(i) නිෂ්පාදනයේ පවත්නා සියලුම වෙළඳ නාම (ප්‍රාරම්භකය සහ ඖෂධීය නාම) වර්ග සංඛ්‍යාව (n) ඔත්තේ අගයක් ගන්නා අවස්ථාවක, මධ්‍යස්ථ සිල්ලර මිල, $(n+1)/2$ ට අනුරූප අගය ලෙස සලකනු ලැබිය යුතු ය; හෝ

(ii) නිෂ්පාදනයේ පවත්නා සියලුම වෙළඳ නාම (ප්‍රාරම්භකය සහ ඖෂධීය නාම) වර්ග සංඛ්‍යාව (n) ඉරට්ටේ අගයක් ගන්නා අවස්ථාවක, මධ්‍යස්ථ සිල්ලර මිල, $n/2$ සහ $(n/2)+1$ යන අවස්ථාවලට අනුරූප වන අගය ලෙස සලකනු ලැබිය යුතු ය.

(ඇ) (ආ) ඡේදයේ (i) වන සහ (ii) වන අනුඡේද යටතේ වන මධ්‍යස්ථ සිල්ලර මිල නිශ්චය කිරීමේ කාර්යය සඳහා, "n" යනු සමුච්චිත ලෙස වෙළඳපොළ කොටසේ වටිනාකම සියයට අසූවක් (80%) හෝ ඊට වැඩි වූ, ඒ නිශ්චිත ඖෂධ සංයෝජනයේ පවත්නා මුළු වෙළඳ නාම (ප්‍රාරම්භකය සහ ඖෂධීය නාම) වර්ග සංඛ්‍යාව ලෙස සලකනු ලැබිය යුතු ය.

5. ඉහත මිල නිර්ණය කිරීමේ ක්‍රමවේදයට අනුකූලව ගණනය කරනු ලබන, යම් නිශ්චිත ඖෂධයක ඖෂධ මාත්‍රා ආකාරයට සහ ප්‍රබලතාවට අදාළ වූ උපරිම සිල්ලර මිල *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබිය යුතු ය.

6. මේ නියෝගවල විධිවිධාන උල්ලංඝනය කරනු ලබන යම් තැනැත්තකු මේ නියෝග යටතේ වරදක් සිදු කරනු ලබන අතර, පනතේ 131 වන වගන්තිය යටතේ අධිකරණය ඉදිරියේ නඩු පවරනු ලැබිය යුතු ය.

7. මේ නියෝගවල කාර්යය සඳහා -

"පනත" යන්නෙන්, 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත අදහස් වේ;

"වෙළඳ නාමය" යන්නෙන්, එක් ඖෂධ අලෙවිකරුවකුගේ ඖෂධය අනෙකුත් ඖෂධ අලෙවිකරුවන්ගේ ඖෂධවලින් වෙන්කර හඳුන්වා දෙනු ලබන යම් නාමයක්, පදයක්, මෝස්තරයක්, ලකුණක්, වෙළඳ ලකුණක් හෝ වෙනත් යම් අංගයක් අදහස් වේ;

"ඖෂධයක ඖෂධීය නාම වර්ගය" යන්නෙන්, :-

(i) එකම ඖෂධීය ස්වරූපය ඇති;
(ii) ජෛව සමතාව සහිත;
(iii) එකම සුරක්ෂිතභාවය සහ ගුණාත්මකභාවයක් සහිත,

ඖෂධ සංයෝගයක් අදහස් වේ;

"වෙළඳපොල කොටසේ වටිනාකම" යන්නෙන්, යම් ලිත් වර්ෂයක් තුළ දී යම් ඖෂධයක වෙළඳ නාමයක හෝ ඖෂධීය නාම වර්ගයක වල වාර්ෂික පිරිවැටුම සහ ලිත් වර්ෂයක් තුළ දී දේශීය වෙළඳපොළෙහි අලෙවි කරන, එකම ප්‍රබලතාව සහ මාත්‍රා ආකාරය සහිත එම ඖෂධයේ සියලුම වෙළඳ නාම සහ ඖෂධීය නාම වර්ගවල මුළු දේශීය විකුණුම් වටිනාකම මත පදනම් වූ දේශීය විකුණුම් වටිනාකම් අනුපාතය අදහස් වේ;

"සිල්ලර මිල" යන්නෙන්, අවසාන පාරිභෝගිකයාට ඖෂධය අලෙවි කරනු ලබන්නා වූ ද, ඇසුරුමේ සඳහන් වූ ද, අදාළ බදු සහ තීරුබදු සමග වූ සිල්ලර මිල හෝ උපරිම මිල අදහස් වේ.

EOG 06 - 0176

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.